මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අවම දඬුවමක් ලබන අපාවාසීන් හට මෙසේ පවසා සිටියි: “සැබැවින්ම ඔබට මහපොළොවේ ඇති යමක් සතුව තිබුණේ නම්, එය වන්දි වශයෙන් පිරිනමන්නෙහි ද?” යැයි විමසයි. ඔහු එයට ‘එසේය’

අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අවම දඬුවමක් ලබන අපාවාසීන් හට මෙසේ පවසා සිටියි: “සැබැවින්ම ඔබට මහපොළොවේ ඇති යමක් සතුව තිබුණේ නම්, එය වන්දි වශයෙන් පිරිනමන්නෙහි ද?” යැයි විමසයි. ඔහු එයට ‘එසේය’ යැයි පිළිතුරු දෙයි. ඔහු: ‘ඔබ ආදම්ගේ කොඳු නාරටියෙහි සිටියදී මීට වඩා පහසු දෙයක් මම ඔබෙන් ඉල්ලුවෙමි. එනම් ඔබ මට ආදේශ
නො කිරීමය. නමුත් ඔබ මට ආදේශ කිරීම හැර අනෙකුත් දෑහි පිටුපෑවෙහිය.” යැයි පවසයි.
[صحيح] [متفق عليه]

නිරයට පිවිසීමෙන් පසු අවම දඬුවමක් ලබන අපාවාසීන් හට: "මෙලොව හා ඒ තුළ ඇති දෑ ඔබ සතු ව තිබුණේ නම්, මෙම දඬුවම වෙනුවට ඔබ ඒවා වන්දි වශයෙන් ගෙවන්නෙහි ද?" යැයි අල්ලාහ් පවසා සිටිනු ඇතැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. ඔහු: "එසේය" යැයි පවසයි. එවිට අල්ලාහ්: ‘ඔබ ආදම්ගේ කොඳු ඇට පෙළ තුළ සිටිය දී මට කිසිවක් ආදේශ නො තබන මෙන් මම ඔබෙන් ප්රතිඥාවක් ගත් අවස්ථාවේ මීට වඩා පහසු දෙයක් මම ඔබෙන් ඉල්ලා සිටියෙමි. නමුත් මම ඔබව මෙලොවට පිටත් කර යැවූ කල්හි, ඔබ ආදේශ කිරීම හැර සෙසු දෑට සම්බන්ධයෙන් මට පිටුපෑවෙහිය.

https://sunnah.global/hadeeth/si/show/8315